# 6. ජේසු බිළිඳුට රැකවරණය

ජේසු බිළිඳා බලන්න ආ පඬිවරු තෑගි බෝග දී යන්නට ගියා. හෙරොද් රජතුමා බලා ගෙන සිටියා. පඬිවරු ඔහු ළඟට ආපසු එනකල්. නමුත් ඔවුන් රාජ මාලිගාවට නැවත ආවේ නැහැ. ජේසුතුමා කවදා හෝ රජ වෙයි කියලා හෙරොද් රජතුමා බය වුණා. ඒ නිසා කුඩා බිළිඳා ව මරන්න සෙවුවා.



මේ බව දේව දූතයෙක් ජෝසප්ට සිහිනයකින් දන්වා කුඩා ජේසු බිළිඳා සමග බෙත්ලෙහෙම් ගමෙන් පිටත් වෙන්න කිවුවා.

ජෝසප්, දේව දූතයා කී දේ අසා ඉක්මනින් ගමනට සූදානම් වුණා. මරියා කොටළුවා පිට නංවා ගෙන කුඩා ජේසු බිළිඳු රෙදිවලින් ඔතා ගෙන රාත්‍රියේ ම මිසරය බලා ගමන් කළා.

කාලය ගත වෙලා ගියා. හෙරොද් රජතුමා හදිසියේ ම මැරුණා. නැවත දේව දූතයෙක් ජෝසප්ට සිහිනයකින් පෙනිලා, ගමට ආපසු යා හැකි බව කිවුවා. නමුත් ඔවුන් බෙත්ලෙහෙමට ගියේ නැහැ. එයට හේතුව හෙරොද් රජතුමාගේ පුතා එහි රජකම් කිරීම යි. ඔවුන් ගලීලයේ නාසරෙත් නම් ගමේ සතුටින් ජීවත් වුණා. දේව පියා මේ වාගේ ම අපවත් ආරක්ෂා කරනවා.

## පැවරුම්

1. ජේසු බිළිඳුගේ උපත පිළිබඳ කතාව රඟ දක්වන්න.
2. ජේසු බිළිඳු මරන්නට සෙවූ රජුගේ නම ලියන්න.
3. ජේසු බිළිඳුගේ උපත සිදු වූ ගමෙහි නම ලියන්න.